# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,224 - 2021 අප්‍රේල් මස 16 වැනි සිකුරාදා - 2021.04.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 890 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මැයි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

887- B 82222 — 5,403 (2021/04)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය (G.O.B.A.) ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

1971 අංක 27 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත මෙම සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරී වන ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *සුදුසුකම් :*

1.1 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හෝ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III නිලධාරියෙකු වීම හෝ, ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු වීම හෝ,

1.2 කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි පන්තියේ නිලධාරියෙකු වීම හෝ පළමු වන පන්තියේ නිලධාරියෙකු වීම වසර 05ක පළපුරුද්ද සහිත ව්‍යාපාර කළමනාකරණ/වානිජ්‍ය විද්‍යා උපාධිය හෝ සමාන සුදුසුකම් සහිත වීම.

2. රාජ්‍ය සේවා හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 142 සමඟ කියවිය යුතු 143 වන රීතිය අනුව හා (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි හෝ) අයදුම්කරු ද්වීතීයන පදනම යටතේ සංගමයේ සේවයට වර්ෂ 2ක කාලයක් සඳහා මුදා හැරිය හැකි බවට සේවා ප්‍රධානී හෝ පත්වීම් බලධාරී හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීයාගේ (සංවෘත සේවා) ලිඛිත එකඟතාවය අනිවාර්යෙන්ම නිලධාරියාගේ ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. ඊට අතිරේකව 143 රීතියේ සඳහන් පරිශිෂ්ඨ 11 සම්පූර්ණ කර ඉදිරිපත් කර තිබිය යුතුය.

3. *තනතුරට හිමි ප්‍රතිලාභ :*

3.1 රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේදී ලබාගත් සම්පූර්ණ වැටුප නොඅඩුව

3.2 ප්‍රවාහන දීමනා හැර තනතුරට හිමි දීමනා

3.3 තනතුරට නියමිත වැටුප් ක්‍රමයේ උපයාගෙන ඇති/පිහිටුවා ඇති මූලික වැටුපෙන් 35%හෝ ඊට වැඩි අතිරේක දීමනාවක්

3.4 රාජ්‍ය සේවයේ හිමි නිවාඩු වලින් ලබානොගත් නිවාඩු සඳහා ඊළඟ වර්ෂය ආරම්භයේදී දීමනා.

3.5 මහා සභාවේ එකඟතාවය මත එක් ලිත් මසක වැටුපට සමාන ප්‍රසාද දීමනා (වෙනස් විය හැක.)

(කරුණාකර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන පුද්ගලයන් අයදුම් කිරීමෙන් වළකින්න.)

4. *පොදු කොන්දේසි :*

4.1 කොළඹ නගරයට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය.

4.2 2021.04.16 දිනට වයස අවු. 50 නොවැඩි වීම.

4.3 රාජ්‍ය සේවයේ අවු. 15කට නොඅඩු සේවා කාලයක්.

4.4 ගිණුම් කටයුතු පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

4.5 පරිගණක සාක්ෂරතාවය හා Internet හා E-mail භාවිතා කිරීමේ හැකියාව

4.6 සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.

2021 මැයි මස 17 වැනි දින මධ්‍යහ්න 12.00ට පෙර ලැබෙන සේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් (ඉහත 2 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එන්. එම් විජේරත්න,
සභාපති.

2021 මාර්තු මස 30 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02
දුරකතන අංක : 011-2434598, 2473633

04-416

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

### අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ).

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය.

නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 මැයි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්ලිව්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 මාර්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | අක්කරපත්තුව | කරුංකොඩිතිව් කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

04-387

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු

**අම්පාර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, විවාහ/අතිරේක විවාහ මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ).

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.
*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 මැයි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2021 මාර්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | කාර්තිව් | කාර්තිව් කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා නින්දවූර්පත්තු කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

04-388

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කැඩෙට් නිලධාරී පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කැඩෙට් නිලධාරීන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා සුදුසුකම් සපුරා ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) විධායක අංශය
(ආ) සැපයුම් අංශය
(ඇ) විදුලි/ විද්‍යුත් ඉංජිනේරු අංශය
(ඈ) නාවික පාබල අංශය
(ඉ) විනයාරක්ෂක අංශය

3. *මූලික අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්වී තිබිය යුතුය.

(ආ) පහත අංශයන් සඳහා අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් 03ක් සමත්ව තිබිය යුතුයි.

| | | |
|---|---|---|
| (1) | විධායක අංශය සඳහා | - ජීව විද්‍යා, භෞතික විද්‍යා, රසායන විද්‍යා සහ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා තිබීම. |
| (2) | නාවික පාබල අංශය සඳහා | - ගණිතය, විද්‍යාව, වාණිජ, තාක්ෂණික හෝ කලා විෂය අ.පො.ස (උ/පෙළ) හදාරා තිබීම. |
| (3) | සැපයුම් අංශය සඳහා | - වාණිජ විෂය ධාරාවෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා තිබීම. |
| (4) | විදුලි/ විද්‍යුත් ඉංජිනේරු අංශය | - භෞතික විද්‍යා, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථ (C) 02ක් සහ සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබීම. |
| (5) | විනයාරක්ෂක අංශය සඳහා | ගණිතය, විද්‍යාව, වාණිජ, තාක්ෂණික හෝ කලා විෂය ධාරාවන්ගෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා තිබීම. |

(ඇ) අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලකුණු 30 ට නොඅඩුව ලබා තිබිය යුතුය.

(ඈ) අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵලවලට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා තිබීම (විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය).

4. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට අයදුම්කරුවන් පහත සඳහන් මූලික සුදුසුකම් අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය. :-

(අ) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
(ආ) වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 22 නොවැඩි විය යුතුයි.
(ඇ) උස : සෙමී 168 (අඩි 5 අඟල් 6) ට නොඅඩු විය යුතුයි (විනයාරක්ෂක අංශය සඳහා සෙ. මී. 170 (අඩි 5 අඟල් 7) ට නොඅඩු විය යුතුයි).
(ඈ) බර : කිග්‍රෑ 52 ට නොඅඩු විය යුතුයි.
(ඉ) පපුව : සෙමී 81(අඟල් 32) ට නොඅඩු විය යුතුයි.
(ඊ) වර්ණ දෘෂ්ටිය : එස්ටීඩී II.
(උ) දෘෂ්ටි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව)
(ඌ) සිවිල් තත්වය : අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම කැඩෙට් නිලධාරියෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත් කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

5. සේවා කොන්දේසිඃ

(අ) අපේක්ෂකයින් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කැඩෙට් නිලධාරීන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. බඳවා ගැනීමේ අංශයන්ට අදාළ මූලික පුහුණුව සාර්ථකව නිම කරන කැඩෙට් නිලධාරීන් වැඩ බලන උප ලුතිනන් නිලයේ අධිකාරියට පත් කරනු ලබයි.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා කැඩෙට් නිලධාරීන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) සියලුම අපේක්ෂකයින් දැනට පවතින නාවික හමුදා පනත, නාවික හමුදා නියෝග සහ නාවික හමුදා පනතේ සංදේශ මඟින් බලගන්වනු ලබන නීති හා උපදෙස්වලට යටත් විය යුතු අතර, මින් මතුවට පනවනු ලබන නීති හා උපදෙස්වලට යටත් වීමට බැඳී සිටිය යුතුයි.

(ඈ) අධිකාරිය සඳහා පුහුණුවන කාල සීමාව තුළ දී යම් කැඩෙට් නිලධාරියෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා නාවික හමුදා ක්‍රියා පිළිවෙතට අනුකූලව ලිඛිතව අනුමැතිය ලබාගත යුතු අතර, ශ්‍රී ලංකා ජනරජය මඟින් එම කැඩෙට් නිලධාරියා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම කැඩෙට් නිලධාරියාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(ඉ) පුහුණුව ලබන කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම් කැඩෙට් නිලධාරියෙකුගේ විනය විරෝධී නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේ දී අදාළ කැඩෙට් නිලධාරියාගේ ඇපකරුවන්/භාරකරුවන් විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමඟ බැඳුම්කරයට ඇතුළත් විය යුතුයි.

(ඊ) පුහුණු කාලය තුළ දී සිදුවන අනතුරුවල දී සහ පූර්ණ කාලීන දුබලතාවලදී දැනට නාවික හමුදාවේ ක්‍රියාත්මක රක්ෂණය මඟින් ආවරණය සලසන අතර, ඒ සඳහා විශේෂ වන්දි ගෙවීමකට හෝ වගකීමකට නාවික හමුදාව බැඳී නොමැත.

6. *වැටුප් හා දීමනා* :

2020.10.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමණාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව

| | | |
|---|---|---|
| (අ) | මූලික වැටුප | - රු. 32,380.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | - රු. 7,800.00 |
| (ඇ) | නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 525.00 |
| (ඈ) | දුෂ්කර දීමනාව(මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඉ) | දුෂ්කර දීමනාව(මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඊ) | අනෙකුත් දීමනා | - අමතර දීමනාව රු. 1,000.00<br>- විශේෂ අමතර දීමනාව රු 3,000.00 |
| (උ) | සුදුසුකම් වේතනය | - රු. 637.50 |

***සටහන.*** කැඩෙට් නිලධාරියාගේ මූලික වැටුප 2020.01.01 දිනට රු.32,380.00 වන අතර මූලික වැටුප වාර්ෂිකව සංශෝධනය වේ.

7. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමි වන පහසුකම්, දීමනා සහ වරප්‍රසාද

(අ) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කලත්‍රයා සහ ළමයින්ට) හිමිවනු ලැබේ.

(ආ) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට කඳවුරේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ (නාවික හමුදා බස්රථ සේවා ක්‍රියාත්මක නොවන ප්‍රදේශ සඳහා).

(ඇ) නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් අයිතමයන් නොමිලයේ සපයනු ලැබේ.

(ඈ) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) බඳවා ගනු ලබන අපේක්ෂකයින් හට ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

(ඊ) විවාහක නිලධාරීන් සඳහා විවාහක නිවාසයන් හී පවතින පුරප්පාඩු මත විවාහක නිවාස අයදුම් කළ හැකි අතර, එසේ වාසය නොකරන විවාහක නිලධාරීන්ට රු.3,200.00 සිට රු.7,700.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

8. *අයදුම්කරුවන්ට උපදෙස් :*

(අ) අ.පො.ස (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකා නොබලන අතර, ක්‍රීඩා අංශයේ තනි තරගවල දී ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දක්වා ඇති දක්ෂතාවයන් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියේ දී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) ඉහත අනු අංක 3 සහ 4 ඡේදයන් හී සඳහන් මූලික සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) බඳවා ගනු ලබන අපේක්ෂකයින්ට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උපාධි පාඨමාලාවන් හෝ දේශීය/විදේශීය උපාධි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව හිමිවනු ඇත.

(ඈ) යම් අයදුම්කරුවෙකුගේ උස/බර/පපුව නියමිත පරිදි නොමැති වුවද, හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

(ඉ) තෝරා ගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝගයන් සහ ව්‍යවස්ථාව පිළිපැදිය යුතුවේ.

(ඊ) පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2021 මැයි මස 10 වැනි දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවා ගැනීම්) , නාවික හමුදා මූලස්ථානය, තැපෙ 593, කොළඹ 01" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "කැඩෙට් නිලධාරී තනතුර" යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195154 මඟින් ලබා ගත හැක.

(උ) ප්‍රතික්ෂේපිත අයදුම්පත් පිළිබඳව දැනුම්දීමක් සිදු කරනු නොලැබේ. තැපෑලේ දී යම් අයදුම්පත්‍රයක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලද බවට දැනුම්දීමක් සිදු කරනු නොලබයි.

(ඌ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන් හී සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(එ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙන යම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය සහ සහතික කරන ලද ඡායාස්ථිතික පිටපතක්
(2) අයදුම් කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික.
(3) පාසල් හැරයාමේ සහතිකය.
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.
(6) මෑතකදී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(7) ක්‍රීඩා හා කැඩෙට් යනාදිය පිළිබඳ සහතික.

(8) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතුයි.

(ඒ) නියම කරන ලද අවස්ථාවන් හී දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඔ) සහතික පත්‍ර සහ ලියකියවිලිවල මුල් පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් නොකළ යුතු අතර තැපැල් මගින් ඉදිරිපත් කරන මුල් පිටපත්වල ආරක්ෂාව පිළිබඳව නාවික හමුදාව වග කියනු නොලැබේ.

(ඕ) ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

9. *බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය* :

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වන අපේක්ෂකයින්ට නාවික හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේ ය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, නාවික හමුදාධිපති සහ ආරක්ෂක අමාත්‍යංශ නියෝජිතයෙකුගෙන් සමන්විත අවසාන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වීම සඳහා අවශ්‍යතා-

| ඉසව්ව | වාර ගණන | කාලය (මිනිත්තු/තත්පර) |
|---|---|---|
| මීටර් 1600 දිවීම | - | මිනිත්තු 06 - 08 අතර |
| Push Up | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Sit Up | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Arm Bending | 05 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Standing Board Jump | 242 සෙ.මී හෝ ඊට වැඩි | - |
| Rope Climbing | - | - |
| Shuttle Run | - | තත්පර 11 |

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මඟින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත්වන අපේක්ෂකයින් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේ ය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන මූලික සම්මුඛ පරීක්ෂණවලින් අසමත් වන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

(උ) අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

(ඌ) සියලුම අයදුම්කරුවන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා නාවික හමුදා මූලස්ථානය මඟින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

10. ශ්‍රී ලංකා නාවික හමුදාවට කැඩෙට් නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල නාවික හමුදාධිපති සතු වන අතර, ජාතික ආරක්ෂාව, නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

*සටහන* - මෙම ගැසට් නිවේදනය සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන්ම පළ වන අතර, සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුයි.

ඩීඑන්එස් උළුගේතැන්න, ආර්එස්පී*, වීඑස්වී,
යූඑස්පී,එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ආධුනික කැඩෙට් නිලධාරි සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. ඉල්ලුම්කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. උපන් දිනය :————.

8. වයස : අවුරුදු : . . . . . . . ., මාස : . . . . . . ., දින : . . . . . (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

9. උස : . . . . . . . (සෙ.මී.) පපුව : . . . . . . . (සෙ.මී.) බර : . . . . . . (කි්‍රි. ග්‍රෑ.)

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

11. දිස්ත්‍රික්කය :————.

12. ඡන්ද කොට්ඨාසය :————.

13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

14. දුරකථන අංකය :————.

15. විවාහක හෝ අවිවාහක බව :————.

16. ස්ත්‍රී පුරුෂ භාවය :————.

17. අධ්‍යාපනය ලැබූ පාසල :————.

18. පාසල් හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ/විශ්වවිද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව)* |
|---|---|---|---|
| | අ. පො. ස. (සා. පෙළ)<br>අ. පො. ස. (උ. පෙළ)<br>වෙනත් | | |

19. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න.) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ කැඩෙට් බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

25. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ ඇඟ බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

27. රජයේ දෙපාර්තමේන්තුවකදී හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුලුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

29. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

04-549

(* මෙම නිවේදනය මෙම ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ අංක 04-624 යටතේ ද පළවේ.)

## වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජීව වෛද්‍ය ඉංජිනේරු (විධායක නිලධර ගණය) III ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2021

වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජීව වෛද්‍ය ඉංජිනේරු (විධායක නිලධර ගණය) III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ස්ත්‍රී /පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :*

1.1 *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් විද්‍යුත්/ විදුලි/ යාන්ත්‍රික / ජීව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සටහන.-** තනතුර සඳහා බඳවා ගැනීමේ දී ජීව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

1.2 *පළපුරුද්ද :*

රජයේ හෝ පෞද්ගලික ආයතනයක ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකු වශයෙන් වසර දෙකක (02) පළපුරුද්දක් ඇති අයට ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ. (සේවා සහතිකයක් මඟින් සනාථ කල යුතු වේ.)

02. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

03. *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුය.
iv. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි. දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීමේ දී වයඹ පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලැබෙන අතර, සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් කිසිවෙක් වයඹ පළාත තුළ නොසිටී නම් අනෙකුත් පළාත්වල අයදුම්කරුවන් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

04. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ SL 1-2016 අනුව රු. 47,615 - 10x1335 - 8x1630 - 17x2170 - 110,895/- වේ.

05. *සේවා කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර ය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

ii. මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

iii. රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 18/2020 ට අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීණතාවක් ලබාගත යුතුය.

iv. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

v. මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ/ උසස් කිරීමේ පටිපාටියේ සඳහන් රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, වයඹ පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධානවලට ද යටත් විය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, නිවේදනයේ දක්වා ඇති සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබේද යන්න සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, ඉන් සුදුසුකම් සනාථ කරනු ලබන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත, පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරට බඳවා ගනු ලැබේ.

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර :

| *ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br>ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය සඳහා | 50 |
| 2. පළපුරුද්ද :<br>රජයේ හෝ අර්ධ රාජ්‍ය හෝ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක :<br>වසර 02 කට වැඩි කාලසීමාවක් සඳහා එක් වසරකට ලකුණු 02 බැගින් (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පිළිගනු ලබන ලිපියකින් හෝ සහතිකයකින් සනාථ කළ යුතුය.) | 20 |
| 3. ක්ෂේත්‍රයට අදාළව කරන ලද පර්යේෂණ හා ප්‍රකාශන (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පිළිගනු ලබන)<br>(ලකුණු 5 x 2 ) | 10 |
| 4. විශේෂ ව්‍යාපෘති සඳහා දායකත්වය හා / හෝ විශේෂ පුහුණුවීම් සඳහා මාස 06 කට වැඩි දායකත්වය ලබා දී ඇති විශේෂ ව්‍යාපෘතියකට/ලබා ඇති ඇති පුහුණුවකට<br>(ලකුණු 5 x 3 ) | 15 |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 |
| **මුළු ලකුණු** | **100** |

08. *විභාග ගාස්තු :*

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තු වශයෙන් රුː 1200/-ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතුය. වයඹ පළාත තුළ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද ව.ප.ස.මු/2 ලදුපත අයදුම්පතට අමුණා (අලවා) එවිය යුතුය.

එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැළකිය යුතුය. මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල :*

9.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2021.05.13** වැනි දින හෝ එදිනට ප්‍රථම **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, **"වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජීව වෛද්‍ය ඉංජිනේරු (විධායක නිලධර ගණය) III ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුය.

9.2 *අත්සන සහතික කිරීම.*- මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/යුද හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ රුː 41,580/- හෝ ඊට ඉහළ මූලික මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.

9.3 දැනටමත් රාජ්‍ය/ පළාත් සභා රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

9.4 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍රම සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

9.5 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය.-2021.05.13

10. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින්ම යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහකෙරෙනු ඇත.

12. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. තවද, නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

13. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම හෝ නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී. බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2021 අප්‍රේල් මස 06 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජීව වෛද්‍ය ඉංජිනේරු (විධායක නිලධර ගණය) III ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2021

01. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන් / දෙමළෙන්) :..................................................
 1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................
 1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..................................................
 1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................
 1.5 විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) :..................................................
 1.6 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය :..................................................

 2.2 දුරකථන අංකය : ජංගම : .............................. ස්ථාවර : ..............................

03. ස්ත්‍රී/ පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. උපන් දිනය : වර්ෂය : .................... මාසය : .................... දිනය : ....................

 4.1 2021.05.13 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

05. 2021.05.13 දිනට ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..................................................

 5.1 එහි පදිංචි කාලය : අවුරුදු : ........................ මාස : ............................... දින : ..........................

06. සුදුසුකම් :-

 6.1 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :-..................................................

 6.2 පළපුරුද්ද :-..................................................

6.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :-........................................................................................................................................

6.4 අතිරේක වෘත්තීය සුදුසුකම් : -.......................................................................................................................................

6.5 අතිරේක පළපුරුද්ද: -......................................................................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර : (වයඹ පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත යුතුය.) :

7.1 ලදුපත් අංකය :-............................................................ මුදල :-.........................................
දිනය :- ......................................
නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..........................................................

| ලදුපත මෙහි අලවන්න. |
|---|

08. අයදුම්කරුගේ සහතිකය :

......................................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි අනාවරණය වුවහොත් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ III ශ්‍රේණියේ ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසළකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :....................................

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ......................................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ ඇය .......................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

අත්සන : .........................................................................................
අත්සන සහතික කරන අයගේ නම : ........................................................................................
තනතුර හා නිල මුද්‍රාව : .........................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතිඥවරයකු/යුද හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ රු. 41,580/- මූලික මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)

*රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ........................................................... මහතා /මහත්මිය /මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයෙකු බවද, ඔහු / ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බවද, මෙම පත්වීම සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බවද , ඔහුගේ / ඇයගේ අයදුම්පතේ දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමග නිවැරදි බව සහ මෙම නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුර සඳහා ඔහු /ඇය සුදුසු බවද මම සහතික කරමි.

.....................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

04-624

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.